# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2004/22 – 2017 ජනවාරි 30 වැනි සඳුදා – 2017.01.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/E/2015/189.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජේ. එස්. ඩබ්ලිව්. බුලත්සිංහල මයා, අංක 20 ඒ, මාදිවෙල පාර, ඇඹුල්දෙණිය, නුගේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

පර්ෂිප් සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 35, එඩ්වඩ් පටුමග, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, අංක 213, එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 දෙසැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/E/2015/189.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජේ. එස්. ඩබ්ලිව්. බුලත්සිංහල මයා, අංක 20 ඒ, මාදිවෙල පාර, ඇඹුල්දෙණිය, නුගේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

පර්ෂිප් සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 35, එඩ්වඩ් පටුමග, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

''පර්ෂිප් සිනර්ජි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ වාප්පු විධායකයෙකු ලෙස සේවය කළ ජේ. එස්. ඩබ්ලිව්. බුලත්සිංහල මහතාට සමාගම විසින් පැවරූ නිෂ්කාශන කාර්යය අංක (Job No.) PS/SI/26/09/14/10094,PS/CL අංක 17345-3 දරන පෞද්ගලික බහාලුම් නිෂ්කාශනයේ දී ඔහු හරහා වැය කරන ලද මුදලින් රු. 3997/- ක මුදලක් නොගෙවා සිටීම තුළින් හා එම සිද්ධියෙන් පසු ඔහු විසින් දරන තනතුර හා සමාන තනතුරුවල සේවය කරන සේවකයන් වෙත ලැබූ හිමිකම් සහ වරප්‍රසාද ලබා නොදී කටයුතු කිරීමෙන් අගතියක් සිදු වී ඇති බවට ඔහු විසින් කරනු ලබන ඉල්ලීම යුක්ති සහගතද? යුක්ති සහගත නම් ඔහුට හිමි සහන මොනවාද යන්න පිළිබඳව වේ.''

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

02 - 595

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.